## " මුස්ලිම්වරුන් අල්ලාහ් යැයි අළුත් දෙවිකෙනෙකුට වඳින බව "

වැරදි මතය 3

සමහර අන්‍යාගමිකයන් සිතන්නේ මුස්ලිම්වරු නමදින්නේ යුදෙව්වන් හා සහ ක්‍රිස්තියානුවන් වන්දනය කරන දෙවියන්ට වඩා වෙනස් දෙවිකෙනෙකුට බවයි. මෙයට හේතුව මුස්ලිම්වරුන් දෙවියන්ට "අල්ලාහ්" යැයි පැවසීම විය හැකිය. නමුත් ඇත්ත වශයෙන්ම මුස්ලිම්වරුන් වඳින්නේ නූහ්, ඉබ්රාහිම්, මූසා, යෙසුස් වන්දනා කළ දෙවියන්වහන්සේටය. අල්ලාහ් යන නාමය සර්වබලධාරී දෙවියන්වහන්-සේ හට අරාබියෙන් කියනා වචනයයි, මෙම වචනය අර්ථ වලින් පෝෂිත එකකි, තවද මෙය දෙවියන්වහන්සේගේ ඒකීයත්වය සහ ඒකීයභාවය අඟවන්නේය. එසේම අරාබිකරයේ ජීවත්වන, අරාබි භාෂාව කතාකරන ක්‍රිස්තියානින් මෙන්ම යුදෙව්වන්ද දෙවියන්වහන්සේ සඳහා භාවිත කරන්නේ අල්ලාහ් යන වචනයයි. ඔබ බයිබලයේ අරාබි භාෂා පරිවර්තනයක් ලබාගත්තේ නම් එහිදී දෙවියන් යන වචනයට අල්ලාහ් යන වචනය යොදා ඇති බව පැහැදිලිව දැක ගැනීමට හැක.

කෙසේවුවත්, මුස්ලිම්වරු, යුදෙව්වන් මෙන්ම ක්‍රිස්තියානුවන් විශ්වාසය කරන්නේ එකම දෙවිකෙනෙකු (මැවුම්කරුවා) වුවද, එකිනෙකා පිළිපදින දෙවියන් පිලිබඳ සංකල්පය සැලකිය යුතු තරමින් වෙනස් වෙයි. උදාහරණයක් ලෙස මුස්ලිම්වරුන්ට අනුව, දෙවියන්වහන්සේ හට හවුල් කරුවන් සිටිය නොහැකිය, දෙවියන්වහන්සේ හැර දේවත්වයෙහි ලා සලකන වෙන අන් කිසිවෙකු සිටිය නොහැක, දෙවියන්වහන්සේ 'ත්‍රිත්වයක' කොටසක් ලෙස ඇඳ නොගනියි, තවද පරිපූර්ණත්වයද ආරෝපණය කරන්නේ දෙවියන්වහන්සේ හට පමණකි.

## " ඉස්ලාමය ත්‍රස්තවාදයට රුකුල් දෙයි "

වැරදි මතය 4

මෙය, ඉස්ලාමයට එරෙහිව ඇති විශාලතම වැරදි මතය විය හැක, විශේෂයෙන්ම මධ්‍යය විසින් නොනවත්වා කරන අසත්‍ය ප්‍රචාරයන් නිසා මෙසේ වියහැක., ඕනෑම මුස්ලිවරයෙකු කිසියම් වූ සාධාරණ සටනක හෝ අසාධාරණ සටනක නියැලුනේ නම් මාධ්‍යය විසින් ඔහුව ත්‍රස්තවාදියෙකු ලෙස නිරූපණය කරයි. ඇත්තටම ඉස්ලාමය ත්‍රස්ථවාදයට රුකුල් දෙනවාද? නිසැකයෙන්ම නැත ! ඉස්ලාමය, අහිංසක ජනතාව අසාධාරණයට ලක් කරන ඕනෑම ක්‍රියාවන්ට සම්පූර්ණයෙන්ම විරුදධ වේ. පීඩාවට, අයුක්තියට හා අසාධාරණයට මුහුණදීමේදී නිශ්ශබ්දව සිටිය යුතුබව ඉස්ලාමය කිසිවිටකත් අවධාරණය නොකරයි.

එලෙස යම් දහමක් හෝ ශිෂ්ටාචාරයක් එවැනි අභියෝග හමුවේ නිශ්ශබ්ද වූයේ නම් එය අනිවාර්යයෙන්ම නැසෙන්නේය. නමුත්, ඉස්ලාමය නිසැකවම, අනාරක්ෂිත පිරිමින් මෙන්ම කාන්තාවන්ට හා ළමයින් හට පහර දීම, කිසිවිටෙක අනුමත කරන්නේ නැත:

දෙවියන්වහන්සේ මෙසේ පවසයි

"අල්ලාහ්ගේ මාර්ගයෙහි ඔබට විරුද්ධව නැගී සිටින්නන් සමග යුද්ධ කරනු. නමුත් ඔබ සීමාව ඉක්මවා නොයනු. අල්ලාහ් සීමාව ඉක්මවන්නන් ප්‍රිය කරන්නේ නැත"
අල්-කුර්ආන් 2:190

v1.02

යුධ අවස්ථාවකදී වුවද, ඉස්ලාමය විසින් ඉතා දැඩි නීති පනවා ඇත. උදාහරණයක් ලෙස, මුස්ලිම්වරුන් සමග සාම ගිවිසුමකට එලඹුනු අයද යුද්ධයට සහභාගී නොවන්නන්ද, කාන්තාවන්ද, ළමයින්වද, මෙහෙක-ාරකයන්, අන්ධයන්, පූජකවරුන්, වැඩිහිටියන්, ආබාධිතයන් මෙන්ම මානසික රොගීන් යනාදී පුද්ලයන්ට හිංසා කිරීමට කිසිම අයිතියක් යුද්ධයේ නියැලෙන කිසිම මුස්ලිම්වරයෙකු හට නැත. ඇත්ත වශයෙන්ම කිවහොත්, මුස්ලිම්වරුන්ට අඩුම තරමෙන් ඔවුන්ගේ බෝග මෙන්ම ගස් වලටවත් හානි කල නොහැකිය. මෙවැනි උදාර මෙන්ම උත්තම නීති රීති මෙලොව ඇති කිසිම යුධ හමුදාවක දකින්නට නැත.

අහිංසක පුද්ගලයෙකු මරණයට පත්කිරීමේ බරපතලකම කුර්-ආනය ඉතා පැහැදිලිව දී පෙන්වා ඇත, එසේම මිනිස් ජීවිතයේ වටිනාකමද අවධාරණය කරයි. එලෙසම එය මුස්ලිම්වරුන් හට අන්‍යආගමිකයන් සමග කරුණාවන්තව හැසිරිය යුතු බව උපදෙස් දෙන්නේය.

"කවුරුන් හෝ (අහිංසක) මිනිසෙකු ඝාතනය කරන්නේද ඔහු මිනිසුන් සියල්ලන්වම ඝාතනය කරන්නෙක් මෙන් වන්නේය. තවද කවුරුන් හෝ එක් මිනිසෙකු ජීවත් කරන්නේද ඔහු මිනිසුන් සියල්ලන්වම ජීවත් කරන්නෙක් මෙන් වන්නේය".
අල්-කුර්ආන් 5:32

"ධර්මය සම්බන්ධයෙන් ඔබ සමග යුද්ධ නොකළ අය සමගද ඔබගේ නිවෙස්වලින් ඔබව බැහැර නොකළ අය සමගද ඔබ සාධාරණව හා කරුණාවන්තව නොහැසිරෙනු යයි ඔබව වැළැක්වූයේ නැත. නියත වශයෙන්ම අල්ලාහ් යුක්ති සහගත අයව ප්‍රිය කරන්නේය".
අල්-කුර්ආන් 60:8

කුර්-ආනයේ ඇති මෙම වාක්‍යය කියැවූ පසුද, ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවලට ඉස්ලාමයට ඇඟිල්ල දිගු කිරීම කෙතරම් සාධාරණද?

## නිගමනය

මිනිසුන්ගේ සාමන්‍ය දැනීම මෙන්ම සහජ බුද්ධියට ගෝචර නොවන ලෙස ඉස්ලාමය නිරූපණය කිරීමට බොහෝ අය උත්සාහ දරයි. ඉස්ලාමය සම්බන්ධව නානප්‍රකාර අදහස් දැරීමට කලින්, මෙය හොඳින් මතකයේ තබාගන්න:

* මෙවැනි අසත්‍ය චෝදනා මෙන්ම වැරදි මත ස්ථාපනය කිරීමෙන් ලාභ ලබන්නේ කවුරුන්ද ?
* මාධ්‍යයෙන් හෝ අන්‍යයන් ගෙන් ඇසුන දෙය හැරෙන්නට ඔබ ඉස්ලාමය ගැන යමක් සොයා බැලුවාද?
* මෙය අමානුශික ජීවන මගක් නම්, ලොව පුරා බිලියන සංඛ්‍යත ජනතාවක් ඉස්ලාමය වැලඳගනීද?

More Information

p (+61) 3 9354-7500 w iisna.com/pamphlets e shareislam@gmail.com

Donation De tail s (Every $1 AUD donated produces 15 pamphlets)

Bank Name Commonwealth Bank Account Pamphlet Project Australia
BSB 063620 Account 10532332 Swift (international) CTBAAU2S

# ඉස්ලාමය පිලිබඳව වැරදි මත

## ඔබ ඇත්තටම දන්නේ මොනවාද?

learn the basics

www.iisna.com/pamphlets